UNITED NATIONS
SRI LANKA

## මාධ්‍ය නිවේදනය

# ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය තම නේවාසික සම්බන්ධීකාරකවරියගේ අභාවයෙන් ශෝකයට පත්වේ

**2018 පෙබරවාරි 23 දින (කොළඹ, ශ්‍රී ලංකාව)**

ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නේවාසික සම්බන්ධීකාරකවරිය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිතවරිය වූ ඌනා මැකෝලි මහත්මියගේ හදිසි අභාවය සාතිශය සංවේගයෙන් දැනුම් දෙනු ලැබේ.

54 වන වියෙහි පසුවූ මැකෝලි මහත්මිය වෛද්‍ය ප්‍රතිකාර ලබමින් පසු වූවා ය.

ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාර ධුරයට පත් ප්‍රථම කාන්තාව වූ ඌනා මැකෝලි මහත්මිය එඩිතර, ප්‍රබෝධවත්, ශක්තිමත් නායිකාවක් වූවා ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරිනිය වූ මැකෝලි මහත්මිය, මෙරට එක්සත් ජාතීන්ගේ නේවාසික සහ අනේවාසික ආයතන 21කින් යුත් එක්සත් ජාතීන්ගේ දේශීය කණ්ඩායමට නායකත්වය දුන් අතර එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ ශ්‍රී ලංකා නියෝජිතවරිය ද වූවා ය. මානව හිතවාදිනියක වූ ඇය, සිය ජීවිතය ලෝක වාසීන්ගේ යහපත උදෙසා කැප කළා ය.

වසර හයක කාලයක් ශ්‍රී ලංකාවේ සේවය කළ ඇය, ඉන් වසර 2ක් ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නේවාසික සම්බන්ධීකාරකවරිය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිතවරිය ලෙස ද, ඊට පෙර ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි (UNICEF) නියෝජිතවරිය ලෙස ද ක්‍රියා කළා ය. ඇය පැනමා සහ ටෝගෝ රාජ්‍යයන්හි එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි (UNICEF) නියෝජිතවරිය ලෙසත්, සුඩානයේ, කෙන්යාවේ සහ ඇන්ගෝලා රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලෙහි (UNICEF) කාර්ය මණ්ඩලයේ ඇතුළුව වසර 17ක කාලයක් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ සේවය කළා ය. ඊට පෙර වසර හතක කාලයක් කුඩා ළමුන්ගේ සුභ සිද්ධිය උදෙසා සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියා කළ ඇය ලොව රටවල් කීපයකම ගෝලීය කාරණා සම්බන්ධ ප්‍රතිපත්ති රාමු සැකසීමට මුලිකත්වය ගෙන ක්‍රියා කළා ය.

අයර්ලන්තයේ හා එක්සත් රාජධානියේ ජාතිකයකු වූ මැකෝලි මහත්මිය දෙදරු මවක විය.

සැහැල්ලු, නිහතමානී, ජව සම්පන්න, නොසැලෙන කැපවීමකින් යුක්ත වූ ඇයගේ අඩුව එක්සත් ජාතීගේ සංවිධානයට අතිශයින්ම දැනෙනු ඇති බව නො අනුමානය. ඇයගේ පවුලේ සාමාජිකයින් හට අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරන්නෙමු.

ආදරණීය ඌනා, ඔබ නැති අඩුව අපට තදින්ම දැනේ.

**නිමාව**